**සන්ධානය බිඳවැටීම හෙවත් දේශපාලන සුනාමිය**

ඒකාබද්ධ යාන්ත්‍රණය පිහිටුවීම පිළිබඳ ප්‍රශ්නය මුල්කරගෙන සන්ධානය බිඳවැටී ඇත. එහි දී අසරණ වී ඇත්තේ සිංහල ජනතාව බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. සන්ධානය බිඳවැටීම පිළිබඳව වඩාත්ම ප්‍රීතියට පත්වන්නෝ දෙමළ ජාතිවාදීහු, බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අධිරාජ්‍යවාදී රාජ්‍ය, ඔවුන්ගෙන් මුදලින් දැනුමෙන් (මතවාදවලින්) යැපෙන්නෝ වෙති. මේ සියල්ලන්ම අයත්වන්නේ විජාතික බලවේගවලට ය. එමෙන් ම ජාතික ව්‍යාපාරය තුළ හිඳිමින් විජාතික බලවේගවල අවශ්‍යතා ඉටුකරන්නන් ද ඒ පිළිබඳව සතුටුවන බව අවධාරණය කළ යුතු ය.

ඒකාබද්ධ යාන්ත්‍රණය පිළිබඳ ව තවම නිශ්චිත ව කිසිවක් නොදන්නා බව සැබෑ ය. එහෙත් ඒ පිළිබඳ කටයුතු කෙරෙන ආකාරයෙන් එහි සැලසුම්කරුවන්ට අවශ්‍ය කුමක් ද යන්න දැනගැනීම අපහසු නැත. ගොනා හැරෙන්නේ කුමක් සඳහා දැයි දැනගැනීමට ගොනා හැරෙනතුරු බලා සිටීමට අවශ්‍ය නැත. අවශ්‍ය වන්නේ පොල් පැලය කා දැමීමට පෙර ගොනා එක්කෝ වෙන තැනකින් බැඳ දැමීම ය. එසේත් නැත්නම් කඹය කෙටිකිරීම හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනයකිරීම ය.

අවාසනාවකට ජ වි පෙරමුණ නො කෙළේ ද එයම ය. රටේ ඒකීය භාවය රැකගැනීමට ජ වි පෙරමුණට අවශ්‍යතාවක් විය. ඒ අවශ්‍යතාව පැහැදිලිව ම චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට නැත. ඇය සන්ධීය රාජ්‍යයක් හා ඇතැම්විට සහසන්ධීය රාජ්‍යයක් වෙනුවෙන් පෙනී සිටියි. ඒකාබද්ධ යාන්ත්‍රණය ඇතිකිරීම පිළිබඳ ව කුමාරතුංග මහත්මිය විසින් නොබෝදා ජ වි පෙරමුණට යවන ලද ලිපියේ අඩංගු කරුණු පරස්පරවලින් ගහණ වන අතර අපි ඒ සමඟ කිසිසේත් එකඟ නොවන්නෙමු.

කොටි සංවිධානය ආණ්ඩුව සමග එකට වැඩකිරීමට පොළඹවාගැනීම මහා කාර්යයක් ලෙස ඇය විසින් හුවාදක්වනු ලැබෙයි. රනිල් වික්‍රමසිංහ මහතා ද කොටි සංවිධානය සමග එකට වැඩකිරීමට ඊනියා සටන් විරාම ගිවිසුමක් අත්සන්කෙළේ ය. මේ යාන්ත්‍රණය එවැන්නක් නොවේ යැයි ජනාධිපතිනිය කියනු ඇත. ඇත්තටම ගතහොත් මෙය එයටත් වඩා එක් අතකින් භයානක ය. කොටි සංවිධානය මේ අවස්ථා දෙකෙහිදී ම ආණ්ඩුව සමග කටයුතු කරන්නේ ආණ්ඩුව හා සම මට්ටමක සිටිමින් ය. අපට ඇති ගැටළුව එය වෙයි. රනිල් වික්‍රමසිංහ මහතා අත්සන්කළ ගිවිසුම කෙටුම්පත්කෙළේ බටහිරයන් බව පැහැදිලි ය. ඒ අත්සන්කරන මොහොත වන තුරු ද ඒ පිළිබඳ ව දැන සිටියේ වික්‍රමසිංහ මහතා සහ ඔහුගේ සමීපතම කිහිප දෙනකු පමණ ය. ඒකාබද්ධ යාන්ත්‍රණය පිළිබඳ ලියැවිල්ල ජනාධිපතිනිය වුව ද තවම හරිහැටි නොදන්නවා විය හැකි ය. එය කෙටුම්පත්කරන්නේ කවුදැයි ඇය කියන්නේ ද? ඒ රාජ්‍ය තාන්ත්‍රික රහසක් යන බටහිරයන් අපට උගන්වා ඇති බොරු ප්‍රකාශයට මුවා වී සිටීමට ඇයට හැකි වුව ද ඉන් එතරම් ප්‍රතිඵලයක් නො ලැබෙයි. බටහිරයන්ගේ හා දෙමළ ජාතිවාදීන්ගේ අවශ්‍යතාවට ඒ කෙරෙන බව ජනාධිපතිනියට ජනතාවගෙන් වසන්කළ හැකි නො වෙයි.

කොටි සංවිධානය කොන්දේසිවලින් තොරව වැඩකිරීමට එකඟ වී ඇතැයි කීම ජනතාව මුළා කිරීමක් වෙයි. ගිවිසුමක් යනු ම කොන්දේසි මාලාවක් වෙයි. උදාහරණයක් ලෙස ගතහොත් ඒකාබද්ධ යාන්ත්‍රණයේ සංයුතිය ආණ්ඩුව විසින් නියම කෙරෙන්නක් නො වෙයි. එහි කොටි සංවිධානයේ නියෝජිතයන් කී දෙනකු සිටින්නේ ද යන්න තීරණය කරන්නේ කවු ද? එහි මෙපමණ කොටි සංවිධානයේ නියෝජිතයන් සිටිය යුතු බවට කොටි කොන්දේසියක් පණවන්නේ නැත් ද?

ඒකාබද්ධ යාන්ත්‍රණයෙන් ව්‍යවස්ථාදායක බලතල කොටි සංවිධානයට නො ලැබෙන බව ඇත්ත ය. එහෙත් කොටි සංඞ්ධානයට පරිපාලන බලතල ලැබෙයි. අප ඒ බව කියන්නේ මේ පිළිබඳ ව කුමාර රූපසිංහ මහතා වැන්නන් කර ඇති ප්‍රකාශ අනුව හා අද බටහිරයන්ට, දෙමළ ජාතිවාදීන්ට හා රාජ්‍ය නොවන සංවිධානවල ගැත්තන්ට අවශ්‍ය කුමක් ද පිළිබඳ ව අප දන්නාදේ පදනම්කරගනිමින් ය. රනිල් වික්‍රමසිංහ මහතාගෙන් ආණ්ඩුව හා සම තත්ත්වයක් කොටි සංවිධානයට ද, ශ්‍රී ලංකා හමුදාව හා සම තත්ත්වයක් කොටි ත්‍රස්තවාදීන්ට ද ලැබුණි. අද කොටින්ට ලැබෙන්නේ ආණ්ඩුව හා සමාන පරිපාලන තත්ත්වයකි. නෛතික වශයෙන් ලබාගන්නා මේ සම තත්ත්ව අවසානයේ දී

© Prof. Nalin De Silva

බටහිරයන්ගේ නීති හා සම්මුතීන් අනුව, බටහිරයන්ගේ ම අතකොළුවක් වූ එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ආයතනවල දෙමළ ඊළම නීත්‍යානුකූලව පිළිගැනීමට සාධක කරගනු ඇත.

මේ පරිපාලනයට කොටි සංවිධානය ආණ්ඩුව හා සම මට්ටමක හවුල්කරගැනීම පරිපාලනය විමධ්‍යගතකිරීමක් ලෙස පෙන්වීමට උත්සාහ ගැනීම අල්ලෙන් විළිවසාගැනීමට කරන උත්සාහයක් පමණකි. පරිපාලය විමධ්‍යගතකිරීම යනු ආණ්ඩුවේ නිලධාරි තන්ත්‍රය විමධ්‍යගතකිරීමක් මිස නිලධාරි තන්ත්‍රයට ත්‍රස්තවාදී හෝ ත්‍රස්තවාදී නොවන හෝ දේශපාලන සංවිධානයක සාමාජිකයන් හවුල්කරගැනීම නො වෙයි. ඒකාබද්ධ යාන්ත්‍රණයට පළමුවෙන් ඒ නම යොදනු ලැබුයේත් ඒ ආණ්ඩුවේ හා ආණ්ඩුව හා සම වූ කොටි සංවිධානයේත් ඒකාබද්ධ පරිපාලන තන්ත්‍රයක් යන්න පැහැදිලි කිරීමට ය. පසුව එහි නම සුනාමි මණ්ඩලයකට වෙනස්කෙරුණේ ද ජනතාවට වැරදි චිත්‍රයක් පෙන්වීම සඳහා ය. කැලය මාරුකළ පමණින් පුල්ලි මාරු නොවන බව කොටි හොඳින් ම දනිති.

සුනාමි මණ්ඩලය හෝ සුසාන මණ්ඩලය අවුරුද්දකට පමණක් සීමා වේ යැයි අපි විශ්වාස නොකරමු. ගිවිසුමේ කුමක් තිබුණත් කොටි තමන්ට අවශ්‍ය කාලයක් එය පවත්වාගෙන යනු ඇත්තේ බටහිරයන්ගේ ද උපකාරයෙන් ය. අවුරුද්දකට සීමාකෙරුණු උතුරු හා නැගෙනහිර පළාත් එකතුකිරීමට සිදු වී ඇත්තේ කුමක් ද? එමෙන් ම සුසාන මණ්ඩලය වෙරළෙන් කිලෝමීටර දෙකකට පමණක් ද සීමා නොවනු ඇත. එය ක්‍රමයෙන් මුළු මහත් උතුරු හා නැගෙනහිර පළාත්වලට ව්‍යාප්තකරන්නේ කෙසේ දැයි නෝර්වේ නියෝජිතයෝ ද කොටි ද දනිති.

ඒකාබද්ධ යාන්ත්‍රණයට ආණ්ඩුවේ සුළු නිලධාරියකු අත්සන්කළ ද ඒ අත්සන්කරන්නේ ආණ්ඩුව වෙනුවෙන් ය. ලංකාව වෙනත් රටවල් සමග ඇතිකරගන්නා ගිවිසුම් සඳහා අත්සන්කරන්නේ බොහෝවිට විදේශ අමාත්‍යාංශයේ හෝ වෙනත් අමාත්‍යාංශයක හෝ නිලධාරියකු ය. එපමණින් ඒ ගිවිසුම් සුළුකොට තැකිය හැකි නො වෙයි. ආණ්ඩුවේ ඇමතිවරු ගිවිසුම් අත්සන්කිරීම සඳහා පිටරට යන්නේ ඔවුන් යෑම අත්‍යවශ්‍ය නිසා නොව ඔවුන්ට පිටරට යෑමට ඇති ආශාව නිසා ය. ඒ ගිවිසුම් සඳහා තානාපති කාර්යාලයේ නිලධාරියකු අත්සන්කිරීම ප්‍රමාණවත් වෙයි.

ඉහත දක්වා ඇති සියළු කරුණු හමුවේ ඒකාබද්ධ යාන්ත්‍රණය පරාජය කළ යුතු ය. කොටි සංවිධානය යනු වෙනම රාජ්‍යයක් ඇතිකිරීම සඳහා ආයුධ අතට ගත් සංවිධානයකි. ඒ පිටුපස බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ බලවේග වෙයි. අද අපට සටන්කිරීමට සිතු වී ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සංස්කෘතික, ආර්ථික හා දේශපාලනික යටත්විජිතවාදය සමග ය. කොටි සංවිධානය තම ඉලක්කය කරා බටහිරයන්ගේ අනුග්‍රහය යටතේ සීරුවෙන් ගමන්කරයි. කොටි සංවිධානය සමග කිසිම ගිවිසුමකට නොඑළඹිය යුත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ නීතිය යටතේ ඒ සෑම ගිවිසුමක් ම අවසානයේ දී ඔවුන්ගේ වාසියට වන බැවින් ය.

ජ වී පෙරමුණ අමාරුවෙන් වුව ද කළ යුතුව තිබුණේ සංධානය තුළ හිඳිමින් ඒකාබද්ධ යාන්ත්‍රණය හෙවත් සුසාන මණ්ඩලය පිහිටුවීමට විරුද්ධව කටයුතුකිරීම ය. තම ව්‍යායාමය අසාර්ථක වී නම් අත්සන්කිරීමෙන් පසුව ඔවුන්ට සංධානයෙන් ඉවත්විය හැකිව තිබුණි. එහෙත් අත්සන්කිරීමට පෙර දින නියම කර කඩිමුඩියේ සංධානයෙන් ඉවත්වූයේ සංධානයෙන් ඉවත්වන්නේ කොයි වෙලාවක දැයි කල්පනාකරමින් සිටියා මෙන් ය. එසේත් නැත්නම් ජාතික හෙළ උරුමය සමග ජාතිකත්වය සඳහා වූ තරගය ජයගැනීමට දින නියම කළා වැනි ය. ජාතික හෙළ උරුමය අත්සන් තැබීමෙන් පසු සන්ධානයෙන් ඉවත්වීමෙන් වැඩක් නැත ආදී ප්‍රකාශ මගින් වැරදි අවබෝධයක් ජනතාවට දීමටත් ජ වි පෙරමුණට ඇමක් දීමටත් කටයුතු කළ බව පෙනෙන්නට තිබුණි. සුසාන මණ්ඩලයට අත්සන් තැබීමට පෙරම දින නියම කිරීමෙන් ජ වි පෙ ජාතික හෙළ උරුමයේ ඇම ගිල්ල බව පෙනී යයි. එය ජ වි පෙට දේශපාලන සුනාමියක් වීමට ඇති ඉඩකඩ බොහෝ ය. තමන් බිල්ලට දීමට කැසකවන ආචාර්ය යුවළකගේ හා වෙනත් බටහිර ඒජන්තයන්ගේ බසට නැමුණහොත් ජ වි පෙටත් ජනතාවටත් 1987 -89 කාලයේ මෙන් අම්හිරි අත්දැකීම්වලට මුහුණ පෑමට සිදුවනු ඇත.

ජාතික හෙළ උරුමය දැන් තම සුසාන මණ්ඩල විරෝධය වෙනස්කර ගනිමින් සිටියි. ඊනියා සංශෝධන සහිතව ඒකාබද්ධ යාන්ත්‍රණය පිළිගැනීමට ඔවුහු කතාකරති. යථාකාලයේ දී ඔවුන් ආණ්ඩුවට එකතුවුණ ද ඒ ගැන පුදුමවිය යුතු නො වෙයි. ඔවුන්ට අවශ්‍ය ව තිබූ එක් කරුණක් නම් දැනට ඉටු වී අවසන් ය. ඒ ජ වි පෙ සන්ධානයෙන් ඉවත්කිරීම ය.

© Prof. Nalin De Silva

අද අභියෝගය ඇත්තේ ශ්‍රී ල නි පක්‍ෂයට ය. ඒ පිහිටුවනු ලැබුයේ මහජන පක්‍ෂයේ හා විජය කුමාරතුංග මහතාගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට නො වෙයි. ලිබරල්වදී පක්‍ෂයක් ලෙස පිහිටුවනු ලැබුව ද, 1955න් පසු ජනතාව ඉදිරියේ ඒ සිංහලත්වයේ පක්‍ෂය විය. ඒකාබද්ධ යාන්ත්‍රණය පරාජය කිරීමට බහුතර සිංහලයන්ට අවශ්‍ය වෙයි. ඒ වුවමනාව ඉටුකරගැනීම සඳහා ව්‍යාජ ව්‍යාපාර පරදවමින්, සිය දිවි නසා නොගෙන ක්‍රියාත්මකවන්නේ කෙසේ ද යන ප්‍රශ්නය අද ජාතික ව්‍යාපාරය හමුවේ වෙයි.

© Prof. Nalin De Silva